හිමිකම් රක්ෂණ අරමුදල

உரிமைகள் காப்புறுதி நிதியம்

Title Insurance Fund



කාර්ය සාධන වාර්තාව හා ගිණුම් - 2023

செயலாக்க அறிக்கை மற்றும் கணக்குகள் - 2023

Performance Report & Accounts - 2023

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

பதிவாளர் நாய்கம் திணைக்களம்

Registrar General's Department

හිමිකම් රක්ෂණ අරමුදල

කාර්ය සාධන වාර්තාව හා ගිණුම් - 2023



රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

පටුන

- කාර්ය සාධන වාර්තාව හා ගිණුම් (සිංහල)
- செயலாற்றுகை (செயல் இலக்கு) அறிக்கை மற்றும் கணக்குகள் (தமிழ்)
- Performance Report & Accounts (English)
- හිමිකම් රක්ෂණ අරමුදලේ සභාපතිතුමාගේ පණිවිඩය
- හිමිකම් රක්ෂණ අරමුදලේ ලේකම්තුමියගේ පණිවිඩය

01. හිමිකම් රක්ෂණ අරමුදල

1.1 හැඳින්වීම

1.2 දැක්ම,මෙහෙවර,අරමුණ

1.3 පනත් හා රෙගුලාසි

1.4 ව්‍යුහය

02. කළමනාකරණ මණ්ඩලය

2.1 කළමනාකරණ මණ්ඩල සාමාජිකයින්

2.2 කළමනාකරණ මණ්ඩල රැස්වීම්

2.3 කළමනාකරණ මණ්ඩලයේ කාර්යයන්

2.4 ලබාගෙන ඇති තීරණ

03. ප්‍රගතිය

3.1 හිමිකම් ලියාපදිංචි කිරීමේ ආදායම

3.2 භාණ්ඩාගාර බැඳුම්කරවල ආයෝජනය කිරීම

3.3 කාර්ය සාධනය

3.4 හානි පූරණය

04. මූල්‍ය වාර්තා

4.1 මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

4.2 මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශනය

4.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

4.4 ලැබීම් හා ගෙවීම් ගිණුම

4.5 ශුද්ධ වත්කම් / ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය

4.6 ශේෂ පිරික්සුම

4.7 මූල්‍ය ප්‍රකාශය පිළිබඳ සටහන්

05. විගණකාධිපතිගේ වාර්තාව

හිමිකම් රක්ෂණ අරමුදලේ සභාපතිතුමාගේ පණිවිඩය

ප්‍රෞඩ ඉතිහාසඝකට උරුමකම් කියන රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව ස්ථාපිත කොට ඇත්තේ වර්ෂ 1864 ජනවාරි මස දීය. එමෙන්ම මෙම දෙපාර්තමේන්තුවෙන් සලසනු ලබන සේවාවන් වඩාත් කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා අවශ්‍ය මංපෙත් එළිපෙහෙළි කරමින් ඉදිරියට ගමන් කරමින් සිටී. මෙම දෙපාර්තමේන්තුව ආරම්භ කළ මුල් අවධියේ ප්‍රමුඛතම කර්තව්‍ය වූයේ ලේඛන ලියාපදිංචි කිරීම වුව ද පසුකාලීනව එනම් වර්ෂ 1867 දී පටන් ශ්‍රී ලාංකීය මහජනතාවගේ සිවිල් අයිතීන් වන විවාහ, උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ කටයුතු ද සිදු කර ඇත.

ඒ අතරින් 1998 අංක 21 දරණ හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත, ඉඩම් කොටසක් පිළිබඳ හිමිකම් විමර්ෂණය කිරීම සහ ලියාපදිංචි කිරීම සඳහා ද ඒ හා සම්බන්ධ හෝ ඊට අනුෂාංගික කාරණා සඳහා ද විධි විධාන සැලැස්ම පිණිස ස්ථාපිත කර ඇත.මෙමගින් ශ්‍රී ලංකාවේ සෑම බිම් ඒකකයක් සඳහාම අනන්‍ය වූ අංකයක් සහිත රජය විසින් හිමිකම තහවුරු කරන ලද අවසානාත්මක ඉඩම් හිමිකමක් ලැබේ. මෙහිදී ඉඩමේ අයිතිය තුළින් ජනතාව ආර්ථික හා මානසික වශයෙන් සවිබල ගැන්වීමක්, ඉඩම් සංවර්ධනය සඳහා වැඩි අවස්ථාවක් ලබා දීමත්, විද්‍යාත්මක ඉඩම් කළමනාකරණයක් සිදු වේ. මෙම වැඩසටහන මිනින්දෝරු දෙපාර්තමේන්තුව හා හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව සමඟ ඒකාබද්ධ වෙමින් ක්‍රියාත්මක වේ. මේ වන විට දිවයින පුරා ඉඩම් කාර්යාල 31ක ස්ථාපිත කර ඇති හිමිකම් ලියාපදිංචි කිරීමේ වැඩසටහන ඉමහත් සේවයක් සපයමින් සාර්ථකව ක්‍රියාත්මක වන අතර මෙය තවදුරටත් ව්‍යාප්ත වීමත් සමඟ මුළු ලංකාවම ආවරණය වන පරිදි ඉඩම් තොරතුරු පද්ධතියක් නිර්මාණය වේ.

මෙහිදී හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ විධි විධාන අනුව යමින්, ඉඩම් හිමිකරුගේ අයිතිය සුරක්ෂිත කිරීම සඳහාත්, ඒ වෙනුවෙන් පාර්ශවකරුවන්ට වන හානිය වැළැක්වීම සඳහා හෝ කිසියම් වෙනත් හේතුවක් මත ඉඩම් අයිතිකරුවන්ට අධිකරණ නියෝග මත වන්දි ගෙවීම සඳහා මෙවැනි හිමිකම් රක්ෂණ අරමුදලක් පිහිටුවා තිබීම ප්‍රශංසනීයයි. අරමුදලේ ප්‍රථම කළමනාකරණ මණ්ඩල රැස්වීම 2010 වර්ෂයේ රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේදී පැවැත්වීමට යෙදුණි. නීති රෙගුලාසි අනුව ක්‍රියාත්මක වෙමින්, හිමිකම් රක්ෂණ අරමුදලේ මුදල් රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කර ඇත. 2023 වර්ෂය අවසාන වන විට සමුච්චිත අරමුදල මිලියන 193 ඉක්මවා ඇත.

කුමන තත්ත්වයක් මතදී වුවද රක්ෂණ මණ්ඩලයේ කටයුතු 2023 වසර තුලදී ද අඛණ්ඩව නිසි පරිදි ඉටු කිරීමට හැකි වීම පිළිබඳ කළමනාකරණ මණ්ඩලයට මෙන්ම කාර්ය මණ්ඩලයට බෙහෙවින්ම ස්තූතිවන්ත වෙමි. මෙම කාර්යභාර්ය නිසි පරිදි ඉටු කිරීමට විෂයභාර අමාත්‍යාංශයෙන් ලැබුණු මඟපෙන්වීම හා උපදේශකත්වය බෙහෙවින් අගය කරමි. අවසාන වශයෙන් වඩාත් විශ්වාසදායී සුරක්ෂිත හිමිකමක් පුරවැසියන් වෙත ලබාදෙනු වස් මෙහි කටයුතු සඳහා ඉදිරියටත් සක්‍රීය දායකත්වය ලබාදීමට අපේක්ෂා කරමි.

ඩබ්.ආර්.ඒ.එන්.එස්.විජයසිංහ

රෙජිස්ට්‍රාර් ජනරාල් / හිමිකම් රක්ෂණ අරමුදලේ සභාපති

හිමිකම් රක්ෂණ අරමුදලේ ලේකම්තුමියගේ පණිවිඩය

1998 අංක 21 දරණ හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 62 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ අධික්ෂණය යටතේ හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් කළමනාකරණය කරන හිමිකම් රක්ෂණ අරමුදල මඟින් යම් ඉඩමක් හෝ ඉඩමක සම්බන්ධතාවයක් පිළිබඳ වංචනික හෝ වැරදි සහගත හිමිකම් ලියාපදිංචියකදි අගතියට පත් වූ තැනැත්තාව අධිකරණ නියෝගයක් මත හානි පූර්ණය කිරීම කරනු ලබයි.

හිමිකම් සහතිකයක් නිකුත් කිරීමෙන් පසුව සිදුවන ගණුදෙනු ලියාපදිංචි කිරීම තුලින් ලැබෙන ආදායමෙන් 40% ක මුදලක් හිමිකම් රක්ෂණ අරමුදල සඳහා බැරවන අතර එයින් පරිපාලන වියදම් හැර ඉතිරිය අංක 1616/23 හා 2009.08.24 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ රෙගුලාසි අනුව රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කරනු ලබයි. මෙමගින් රක්ෂණ අරමුදල තව දුරටත් වර්ධනය වන අතර ආරම්භයේදි රු.මි.0.46 පැවති එය 2023 අවසන් වන විට රු.මි.193 දක්වා වර්ධනය වී ඇත.

අරමුදල ආරම්භයේ සිට මේ දක්වා හානි පූරණය සඳහා කිසිදු අධිකරණ නියෝගයක් ඉදිරිපත්ව නැති අතර මෙමගින් හිමිකම් ලියාපදිංචියේදි වංචනික හෝ වැරදි සහගත හිමිකම් ලියාපදිංචි කිරීම් අවම බව විදහා දැක්වෙන බව අදහස් කරමි.හිමිකම් රක්ෂණ අරමුදල සම්බන්ධව හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව හා සම්බන්ධව පවත්වනු ලබන දැනුවත් කිරීම් වැඩසටහන් වලදි කටයුතු සිදු කරන අතර, අප දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් හා පලාත් කාර්යාල හරහාද සිදුවන මහජන හමුවීම් වලදි ද දැනුවත් කිරීමට පියවර ගෙන ඇත. ඉදිරියේදි තව දුරටත් මේ සම්බන්ධව ප්‍රචාරණය කිරීමට සාකච්ජා කරමින් පවති.

කළමනාකරණ මණ්ඩලය විසින් ගනු ලබන තීරණ ක්‍රියාත්මක කරමින් රක්ෂණ අරමුදලේ කටයුතු සාර්ථකව ඉටු කර ගැනීමට මේ වන විට කටයුතු කරගෙන යන අතර ඒ සම්බන්ධයෙන් කළමනාකරණ මණ්ඩලයට ද මග පෙන්වීම හා උපදේශකත්වය ලබාදීම වෙනුවෙන් රක්ෂණ අරමුදලේ සභාපති රෙජිස්ට්‍රාර් ජනරාල්තුමාට ද බෙහෙවින් ස්තූතිවන්ත වෙමි. ඒ අනුව හිමිකම් රක්ෂණ අරමුදලේ කළමනාකරණ මණ්ඩලය හා කාර්ය මණ්ඩලය සමඟ හිමිකමේ අයිතිය ලියාපදිංචිය තුලින් අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට ජනතාවට සහාය වීම සඳහා සක්‍රීය දායකත්වයක් ලබා දීමට ඉදිරියටත් අපේක්ෂා කරමි.

ජේ.ඒ.එස්.කේ.කරුණාරත්න

සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල් / හිමිකම් රක්ෂණ අරමුදලේ ලේකම්

01. හිමිකම් රක්ෂණ අරමුදල

1.1 හැඳින්වීම

1998 අංක 21 දරණ හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත අනුව ඉඩම් මැන නිරවුල් කර, හිමිකම ලියාපදිංචි කිරීමේ කටයුතු සිදු කර අදාල පාර්ශවකරුවන් වෙත හිමිකම් සහතික ලබාදීම සිදුකරගෙන යනු ලැබේ. මේ සඳහා මෙම දෙපාර්තමේන්තුව යටතේ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල 31ක හිමිකම් ලියාපදිංචි කිරීමේ කටයුතු දැනටමත් සිදු කරගෙන යනු ලබයි. පෙර සඳහන් පනතේ විධිවිධාන අනුව ඉඩම් අයිතිකරුගේ ඉඩම්වල අයිතිය සුරක්ෂිත කිරීම සඳහාත්, ඒ වෙනුවෙන් පාර්ශවකරුවන්ට වන හානිය වැළැක්වීම සඳහා හෝ කිසියම් වෙනත් හේතුවක් මත ඉඩම් අයිතිකරුවන්ට වන හානියට වන්දියක් ලෙස කිසියම් මුදලක් අධිකරණ නියෝගයක් මත ප්‍රතිපූර්ණය කිරීමට පනතේ ඉඩකඩ සලසා ඇත.

ඒ අනුව 1998 අංක 21 දරණ හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 62(1) වගන්තිය පරිදි ශ්‍රී ලංකා මහ බැංකුවේ අධීක්ෂණය යටතේ හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් කළමනාකරණය කළයුතු හිමිකම් රක්ෂණ අරමුදල පිහිටුවීම සඳහා ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යවරයා සහ ඉඩම් අමාත්‍යවරයා විසින් 2003 ජුනි මස ඉදිරිපත් කරන ලද පොදු අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා 2003.10.08 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත.

ඒ අනුව හිමිකම් රක්ෂණ අරමුදල පිහිටුවීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇති අතර රක්ෂණ අරමුදලට අදාල නියෝග අංක 1616/23 හා 2009 .08.24 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රසිද්ධ කර ඇත. එකී රෙගුලාසිවලට අනුව හිමිකම් රක්ෂණ අරමුදල සඳහා 2009 වර්ෂයේදී කළමනාකරණ මණ්ඩලයක් පත්කර ඇති අතර 2010.02.23 වන දින ප්‍රථම කළමනාකරණ මණ්ඩල රැස්වීම රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේදී පවත්වා ඇත.

හිමිකම් රක්ෂණ අරමුදලේ බැංකු ගිණුම ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිර්දේශ කරන ලද බැංකුවක ආරම්භ කිරීමට තීරණය කර ඇති අතර ඒ අනුව ලංකා බැංකුව බත්තරමුල්ල ශාඛාවේ අදාල ගිණුම ආරම්භ කර ඇත. මෙම අරමුදලට මුදල් එකතු වන්නේ හිමිකම් ලියාපදිංචි කිරීමට අදාල පසු ගණුදෙනු ලියාපදිංචි කිරීම සඳහා අයකරනු ලබන ගාස්තු වලිනි. රක්ෂණ අරමුදල සම්බන්ධයෙන් වූ නියෝග ඇතුලත් අංක 1616/23 හා 2009.08.24 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය පරිදි මාසය තුල හිමිකම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත ලැබුණු ආදායමින් 40% ක් රක්ෂණ අරමුදලේ ගිණුමට බැර කරනු ලැබිය යුතු අතර එම මුදලින් 25%ක් අරමුදලේ පරිපාලන වියදම් දැරීම සඳහා රෙජිස්ට්‍රාර් ජනරාල්ගේ ගිණුමට ගෙවනු ලැබිය යුතුය.

එකී ගැසට් පත්‍රයේ සඳහන් පරිදි රක්ෂණ අරමුදලේ මුදල්වලින් හැකි උපරිම ප්‍රතිශතයක් රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කළයුතු අතර 2023 වර්ෂය අවසාන වන විට එසේ ආයෝජනය කරන ලද හිමිකම් රක්ෂණ අරමුදලේ මුළු සමුච්චිත අරමුදල රු.193,211 ,589.98 ක් වේ.

1.2 දැක්ම

හිමිකමේ අයිතිය ලියාපදිංචිය තුලින් අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට ජනතාවට සහය වීම.

මෙහෙවර

නිශ්චිත දේපලවලට අදාලව නීත්‍යානුකූල හිමිකමේ අයිතිය, රජයේ වගකීමක් සහිතව ලියාපදිංචි කිරීමේදී සිදු විය හැකි වංචනික ක්‍රියා හේතුවෙන් හෝ වෙනයම් ආකාරයක අතපසුවීමක් හේතුවෙන් අයිතිය සම්බන්ධයෙන් වන වැරදි තීරණයක් නිසා පාර්ශවකරුවන්ට සිදුවන හානිය සම්බන්ධයෙන් වන්දි ප්‍රධානය කිරීම හා එම දේපලවලට අදාල ලේඛණ සංරක්ෂණය කිරීමෙන්ද එම ලේඛණ වලින් සහතික පිටපත් නිකුත් කිරීමෙන්ද ඉඩමේ අයිතිය රැක ගැනීම පිණිස මහජනතාවට සහාය වීම.

අරමුණු

1998 අංක 21 දරණ හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත මඟින් ඉඩම් සම්බන්ධයෙන් ඔප්පු මඟින් සිදුවන ගණුදෙනු ලේඛනගත කිරීම වෙනුවට ඉඩම්වල අයිතිය ලියාපදිංචි කිරීම සිදු කරනු ලබයි. මෙම අයිතිය ලියාපදිංචි කිරීමේදී සිදු විය හැකි වංචනික ක්‍රියා හේතුවෙන් හෝ වෙනයම් ආකාරයක අතපසුවීමක් හේතුවෙන් අයිතිය සම්බන්ධයෙන් වන වැරදි තීරණයක් නිසා පාර්ශවකරුවන්ට සිදුවන හානිය සම්බන්ධයෙන් රජය වගකීමට බැඳෙන අතර, ඒ අනුව සිදුවන අලාභය වෙනුවට වන්දි ප්‍රදානය කිරීමට මෙම පනතේ විධිවිධාන සළසා ඇත. මෙම අරමුණු ඇතිව හිමිකම් රක්ෂණ අරමුදල පිහිටුවන ලදී. මෙම හානිපූර්ණය කිරීමේදී පනතේ විධිවිධාන අනුව අධිකරණ ක්‍රියාමාර්ගයකට යොමුවිය යුතු අතර අධිකරණය මඟින් දෙනු ලබන තීන්දුවක් මඟින් අදාල පාර්ශවවලට ගෙවිය යුතු වන්දි මුදල තීරණය කරනු ලැබේ.

1.3 පනත් හා රෙගුලාසි

- 1998 අංක 21 දරණ හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත

- අංක 1616/23 හා 2009.08.24 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය

1.4 ව්‍යුහය

කළමනාකරණ මණ්ඩලය

- හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල් සභාපති විය යුතුය
- හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව භාරව සිටින අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නම් කරනු ලබන නියෝජිතයෙක්
- ඉඩම් විෂය භාරව සිටින අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නම් කරනු ලබන එම අමාත්‍යාංශයේ නියෝජිතයෙක් ;
- මුදල් විෂයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නම් කරනු ලබන එම අමාත්‍යාංශයේ නියෝජිතයෙක් ;
- ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිවරයා විසින් නම් කරනු ලබන එම බැංකුවේ නියෝජිතයෙක් ; සහ
- ප්‍රධාන තක්සේරුකරු

කාර්යය මණ්ඩලය

- හිමිකම් අංශය - සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල් (හිමිකම්) - ලේකම්
  කළ.සේවා නිලධාරී (ආයතන කටයුතු)
- මුදල් අංශය - ප්‍රධාන ගණකාධිකාරී - මූල්‍ය කටයුතු
  කළ.සේවා නිලධාරී (ආදායම් සම්බන්ධ කටයුතු)
  කළ.සේවා නිලධාරී (මුදල් පොත හා ගෙවීම් කටයුතු)
  කළ.සේවා නිලධාරී (ගිණුම් කටයුතු)
- අභ්‍යන්තර විගණන අංශය - ප්‍රධාන අභ්‍යන්තර විගණක (විගණන කටයුතු)
  කළ.සේවා නිලධාරී (විගණන කටයුතු සඳහා සහය වීම)

02. කළමනාකරණ මණ්ඩලය

2.1 2023 වර්ෂයේ කළමනාකරණ මණ්ඩල සාමාජිකයින්

- හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල් (සභාපති) - ඩබ්.ආර්.ඒ.එන්.එස්.විජයසිංහ මයා
- රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ නියෝජිත,
  ප්‍රධාන ගණකාධිකාරී, ස්වදේශ කටයුතු අංශය - යූ.ජී.ආර්.දමයන්ති මිය
- ඉඩම් අමාත්‍යාංශයේ නියෝජිත,
  ප්‍රධාන ගණකාධිකාරී, සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය - ඊ.එල්.ඒ.පී.කුමාර මයා
- මුදල් අමාත්‍යාංශයේ නියෝජිත,
  ප්‍රධාන අභ්‍යන්තර විගණක - හේමා සුරේෂ්කුමාර් මිය
- ශ්‍රී ලංකා මහ බැංකුවේ නියෝජිත,
  අධිකාරී, සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව - ඩී.එල්. නිහාල් මයා
- ප්‍රධාන තක්සේරුකරු, තක්සේරු දෙපාර්තමේන්තුව - පී.ඩී.ඩී.එස්.මුතුකුමාරණ මිය

2.2 කළමනාකරණ මණ්ඩල රැස්වීම්

- වැඩවල ස්වභාවය සහ ප්‍රමාණය සැලකිල්ලට ගෙන අවශ්‍යයයි මණ්ඩලයේ සාමාජිකයන් විසින් සළකනු ලබන කවර හෝ අවස්ථාවකදී මණ්ඩලය රැස්විය යුතු අතර, අවම වශයෙන් අර්ධ වාර්ෂිකව ජනවාරි මස සහ ජූලි මාසවලදී මණ්ඩලය රැස්විය යුතු ය.
- සෑම වර්ෂයකම ජනවාරි මාසයේදී මණ්ඩලයේ වාර්ෂික මහා සභා රැස්වීම පැවැත්විය යුතුය.
- මණ්ඩලයේ යම් රැස්වීමක් සඳහා සණ පූර්ණය සාමාජිකයන් තිදෙනෙකු විය යුතුය.
- මණ්ඩලයේ සභාපතිවරයා පැමිණ සිටින්නේ නම් මණ්ඩලයේ සෑම රැස්වීමකදීම ඔහු මුලසුන දැරිය යුතුය. යම් රැස්වීමකට සභාපතිවරයා පැමිණ නොමැති විට පැමිණ සිටින සාමාජිකයින් අතරින් තෝරා පත්කර ගනු ලබන සාමාජිකයෙකු එම රැස්වීමේ මුලසුන දැරිය යුතුය.

2.3 කළමනාකරණ මණ්ඩලයේ කාර්යයන්

(අ) සමස්ථ වශයෙන් අරමුදලේ කළමනාකාරිත්වය සහ පරිපාලනය සඳහා වගකීම.

(ආ) පනතේ විධිවිධාන ප්‍රකාරව හානි පූර්ණය සඳහා වූ හිමිකම්පෑමක් සාධාරණද නැද්ද, යන්න පිළිබඳව හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාට උපදෙස් දීම.

(ඇ) මණ්ඩලයේ කර්තව්‍ය සහ වගකීම් කාර්යක්ෂම ලෙස ඉටු කිරීම සඳහා එහි කාර්ය පටිපාටිය පාලනය කරන නීති සහ මාර්ගෝපදේශ සැදීම සහ අනුගමනය කිරීම.

(ඈ) හානිපූර්ණය සඳහා වූ හිමිකම්පෑම් විමර්ශනය කිරීම සහ මේ පනත යටතේ හානිපූර්ණය ගෙවීමට අදාල වනුයේ යම් තැනැත්තකුගේ සාවද්‍යතාවය ද, එම තැනැත්තන් හඳුනාගැනීම සහ අරමුදලේ යථා තත්ත්වයට පත්කිරීම සඳහා එම තැනැත්තන්ගෙන් අයකරගත යුතු මුදල් ප්‍රමාණය තීරණය කිරීම

(ඉ) (ඈ) ඡේදය යටතේ අරමුදලට සිදු වූ අලාභය අයකර ගැනීම සඳහා හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග පිළිබඳව ඔහුට උපදෙස් දීම.

(ඊ) අරමුදලේ ගිණුම්වලට අදාල වාර්තා සහ අරමුදල ක්‍රියාත්මක වීම පිළිගත් ප්‍රමිතිවලට අනුකූලව පවත්වාගෙන යනු ලබන්නේද යන්න විමර්ශනය කිරීම සහ අවශ්‍ය අවස්ථාවන්හිදී ඒ සම්බන්ධයෙන් හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාට උපදෙස් දීම.

(උ) මණ්ඩලය විසින් කටයුතු කරනු ලබන සියලු කාරණාවලට අදාල වූ වාර්තාවල නිරවද්‍යතාවය, අංගසම්පූර්ණ බව සහ ආරක්ෂාව පිළිබඳ සහතික කිරීම සඳහා අවශ්‍ය සියලු පියවර ගැනීම.

(ඌ) හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් සහ මහ බැංකුව විසින් පිළියෙල කර ඉදිරිපත් කරනු ලබන සියළු මූල්‍ය ප්‍රකාශ සමාලෝචනය කිරීම.

(එ) අරමුදල මුදල් ලැබීම සහ අරමුදලින් මුදල් පිටතට යෑම පිළිබඳව නිතිපතා සමාලෝචනය කිරීම සහ යම් අහිතකර අවස්ථාවන් නිවැරදි කිරීම සඳහා උචිත පියවර ගැනීම.

(ඒ) වාර්ෂික ඇස්තමේන්තුගත පරිපාලනමය වියදම් සමාලෝචනය කිරීමෙන් පසු සහ අවශ්‍ය නම් ප්‍රතිශෝධනය කිරීමෙන් පසු ඒවා අනුමත කිරීම.

2.4 කළමනාකරණ මණ්ඩලය විසින් ලබාගෙන ඇති තීරණ

- රක්ෂණ අරමුදලේ ලේකම් ලෙස සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්(හිමිකම්) තනතුරේ කටයුතු කරන තැනැත්තා පත්කළ යුතුය.

- නිත්‍ය තනතුරු ඇතිකරන තෙක් අරමුදලේ ගිණුම් පවත්වාගෙන යාම රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරී තනතුරේ රාජකාරී ඉටුකරනු ලබන තැනැත්තා විසින් ඉටුකළ යුතුය.

- අරමුදලේ කටයුතු සඳහා ගිණුම් අංශයේ කළමනාකරණ සේවයේ නිලධාරීන් තිදෙනෙකු හා හිමිකම් අංශයේ කළමනාකරණ සේවයේ එක් නිලධාරියෙක් හෝ රෙජිස්ට්‍රාර් සේවයේ එක් නිලධාරියෙකු පත් කළ යුතුය.

- ඉහත සියලු පත්කිරීම් හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල්ගේ අනුමැතිය මත සිදු විය යුතුය.

- අරමුදලේ මුදල් ආයෝජනය කිරීම භාණ්ඩාගාර බැඳුම්කරවල/බිල්පත්වල කළ යුතුය.

- සෑම ආයෝජනයකදීම රජයේ බැංකු 3ක මිල කැඳවීම් ලබාගැනීමෙන් පසුව උපරිම ප්‍රතිලාභ හිමිවන භාණ්ඩාගාර බැඳුම්කර/බිල්පත්වල ආයෝජනය කළයුතුය.
- ඒ සඳහා කළමනාකරණ මණ්ඩලය නියෝජනය කරන මහ බැංකුවේ නියෝජිතගේ ලිඛිත /වාචික එකඟතාවය ලබා ගැනීම සුදුසුය.

- ගණකාධිකාරී / ලේකම් අනුමැතිය මත Repo ක්‍රමයට ආයෝජනය කිරීම සඳහා උපරිම කාලය මාස තුනක් විය යුතුය.

- මාස තුනකට වැඩි Repo ක්‍රමයට ආයෝජනය සඳහා කළමනාකරණ මණ්ඩලයේ අනුමැතියට යටත්ව හිමිකම් රෙජිස්ට්‍රාර් ජනරාල්ට අනුමැතිය ලබාදිය හැකිය

- හිමිකම් පනත යටතේ අයකරනු ලබන ගාස්තුවලින් 60%ක් ඒකාබද්ධ අරමුදලට ගෙවනු ලැබිය යුතුය.

- මාසය තුල හිමිකම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත ලැබුණු ආදායමින් 40% ක් ඔහු විසින් ඊළඟ මාසයේ දහවෙනිදාට පෙර රක්ෂණ අරමුදලේ ගිණුමට බැර කරනු ලැබිය යුතුය.

- වියදම් පියවීමේ කාර්යය සඳහා රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගේ ගිණුමට හිමිකම් රක්ෂණ අරමුදලේ ගිණුමට ගෙවන ලද ගාස්තුවලින් සියයට විසිපහක් (25%) මාරු නොකර **සත්‍ය වියදම පමණක්** මාරු කිරීම කළ යුතුය.

- හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල්ගේ ගිණුමට පාර්ශවකරුවන් විසින් වැරදීමකින් හෝ අතපසුවීමකින් බැර කර ඇති මුදල් ආපසු ගෙවීමට සිදුවන අවස්ථාවලදී හිමිකම් රෙජිස්ට්‍රාර් ජනරාල්ගේ මාසික ගිණුම් ගැලපීමෙන් පසු අදාල පාර්ශවකරුවන්ට ගෙවීමට ප්‍රධාන ගණකාධිකාරී විසින් කටයුතු කළ යුතුය.

- හිමිකම් රක්ෂණ අරමුදලේ විගණන කටයුතු රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අභ්‍යන්තර විගණක තනතුරේ රාජකාරි ඉටුකරනු ලබන තැනැත්තා ඉටු කළ යුතුය.

- අභ්‍යන්තර විගණකගේ සහායට ඔහු විසින් නම් කරනු ලබන තවත් එක් නිලධාරියෙකු පත්කරගත යුතු අතර හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල්ගේ අනුමැතිය මත එම පත්කිරීම් කළ යුතුය.

- විගණකාධිපතිගේ ගාස්තු අරමුදලේ පරිපාලන වියදම්වලින් ගෙවිය යුතුය.

- විගණන කමිටු රැස්වීම දෙපාර්තමේන්තු මගින් නොපවත්වා විගණන කමිටු සාමාජිකයන් විසින් පැවැත්විය යුතු බව තීරණය විය.

03. ප්‍රගතිය

3.1 හිමිකම් ලියාපදිංචි කිරීමේ ආදායම


උපලේඛන අංක -01

2023.12.31 දිනට හිමිකම් ආදායම්

මාසය	60%	40%*	එකතුව
ජනවාරි	2,756,277.00	1,837,518.00	4,593,795.00
පෙබරවාරි	3,984,087.00	2,656,058.00	6,640,145.00
මාර්තු	4,701,465.00	3,134,310.00	7,835,775.00
අප්‍රේල්	3,531,339.00	2,354,226.00	5,885,565.00
මැයි	4,272,018.00	2,848,012.00	7,120,030.00
ජූනි	4,254,765.00	2,836,510.00	7,091,275.00
2023 ජූලි	4,836,552.00	3,224,368.00	8,060,920.00
2023 අගෝස්තු	4,930,620.00	3,287,080.00	8,217,700.00
2023 සැප්තැම්බර්	4,713,522.00	3,142,348.00	7,855,870.00
2023 ඔක්තෝබර්	5,414,991.00	3,609,994.00	9,024,985.00
2023 නොවැම්බර්	5,066,892.00	3,377,928.00	8,444,820.00
2023 දෙසැම්බර්	4,609,098.00	3,072,732.00	7,681,830.00
	53,071,626.00	35,381,084.00	88,452,710.00


* හිමිකම් රක්ෂණ මුදලේ ආදායම්

3.2 භාණ්ඩාගාර බැඳුම්කරවල ආයෝජනය කිරීම




3.3 කාර්ය සාධනය

2023 වර්ෂයේ හිමිකම් රක්ෂණ අරමුදලේ ඇස්තමේන්තුගත ආදායම රු. 36,000,000.00 ක් වූ අතර රක්ෂණ අරමුදලට බැරවූ සත්‍ය ආදායම රු. 35,381,084.00ක් විය. ඒ අනුව 2023 වර්ෂයේ හිමිකම් රක්ෂණ අරමුදලට බැර වූ අදායම, 2022 වර්ෂයේ හිමිකම් රක්ෂණ අරමුදලට බැර වූ අදායමට වඩා 20,816,210.48 කින් වර්ධනය වී තිබුණි. 2023 වර්ෂයේ දී හිමිකම් පනත යටතේ ලියාපදිංචි කිරීමේ ගාස්තු වැඩිවීම ආදායම වර්ධනට හේතු වී ඇත.



හිමිකම් රක්ෂණ අරමුදල සම්බන්ධයෙන් අංක 1616/23 හා 2009.08.24 දිනැති ගැසට් පත්‍රයේ ප්‍රතිපාදන අනුව කළමනාකරණ මණ්ඩලයේ උපදෙස් මත 2023 වර්ෂයේ රුපියල් මිලියන 34,316,026.57 ක නව ආයෝජනයක් සිදු කරන ලදී.

2023 වර්ෂයේ සංශෝධිත ඇස්තමේන්තුගත භාණ්ඩාගාර බිල්පත් පොළී ආදායම රු. 20,000,000.00 ක් වූ අතර සත්‍ය වශයෙන් ලද පොළී ආදායම රු. 20,569,533.87ක් විය.



මෙම රක්ෂණ අරමුදල සඳහා අරමුදල් රැස් කරනු ලබන්නේ ලියාපදිංචි කර ඇති හිමිකම් සහතිකවලින් කරනු ලබන පසුගණුදෙනු ලියාපදිංචි කිරීම සඳහා අයකරනු ලබන ගාස්තු එකතු කිරීම තුළිනි. මේ දක්වා නිකුත් කර ඇති හිමිකම් සහතිකවලට අදාලව පසුගණුදෙනු සාධනපත්‍ර 52,139 ක් 2023 වර්ෂය තුළ ලියාපදිංචි කර සහතික නිකුත් කරන ලදී.

2022 වර්ෂයේදී හිමිකම් රක්ෂණ අරමුදලේ සමුච්චිත අරමුදල රු. 138,326,029.54 ක් වන අතර 2023 වර්ෂය අවසාන වන විට මෙහෙයුම් අතිරික්තය එකතු කිරීමෙන් පසුව මුළු සමුච්චිත අරමුදල රු. 193, 211,589.98 ක් වේ.

හිමිකම් රෙජිස්ට්‍රාර් ජනරාල්ගේ සභාපතිත්වයෙන් යුත් කළමනාකරණ මණ්ඩලය මෙම වර්ෂය තුල සිව්වරක් රැස්විය. 2024 වර්ෂයේදී දෙපාර්තමේන්තුවේ විගණන කමිටුවට සමගාමීව රක්ෂණ අරමුදලේ විගණන කමිටුව තෙවරක් පවත්වන ලද අතර රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාරව 2016 වර්ෂයේදී පත් කරන ලද හිමිකම් රක්ෂණ අරමුදලේ විගණන කළමනාකරණ කමිටුව මෙම වර්ෂයේදී එක්වරක් රැස්විය.

එමෙන්ම රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ උපදෙස් පරිදි 2022 වර්ෂයේ සිට කාර්ය සාධන වාර්තාව භාෂා ත්‍රිත්වයෙන් මුද්‍රණය කිරීම ආරම්භ කරන ලදී.

3.4 හානි පූර්ණය

අංක 1616/23 හා 2009.08.24 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ 22 වන වගන්තිය පරිදි යම් ඉඩමක හෝ යම් ඉඩමක සම්බන්ධතාවයක් පිළිබඳ වංචනික හෝ වැරදි සහගත හිමිකම් ලියාපදිංචියක් සිදු වී ඇත්නම් එය සිදු වී අවුරුදු 3 ක් ඇතුලත අගතියට පත් වූ තැනැත්තා විසින් හානිපූර්ණයක් ලබා ගැනීම සඳහා අධිකරණයේ නඩුවක් දැමිය යුතුය.

හිමිකම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා සහ අගතියට පත් පාර්ශවය සඳහා වංචාවක් සිදු කර පාඩු සිදු කල හෝ ඊට දායක වූ තැනැත්තා හෝ තැනැත්තන් සම විත්තිකරුවන් කරනු ලැබේ.


ගැසට් පත්‍රයේ 25 වන වගන්තිය අනුව අගතියට පත් පාර්ශවය විසින් අධිකරණයට දැමූ නඩුව සඳහා හානිපූර්ණය ගෙවිය යුතු බවට අධිකරණය විසින් අඥාවක් කරනු ලැබූ අවස්ථාවක අධිකරණ අඥාවට එරෙහිව අභියාචනයක් ඉදිරිපත් කර නොමැති නම් අධිකරණ අඥාවේ දින සිට මාස 3ක් ඇතුලත එම හානිපූර්ණය සිදු කල යුතුය.

එමෙන්ම හානිපූර්ණය කිරීම මාස 3කට වැඩි කාලයක් ප්‍රමාද කරනු ලබන අවස්ථාවක සම්පූර්ණ හානිපූර්ණ මුදල ගෙවා නිම වන තුරු එකී හානිපූර්ණ මුදල හෝ ඉතිරිව ඇති එහි ශේෂය මත නෛතික පොළිය ගෙවනු ලබයි.

මේ වන තෙක් අරමුදලෙන් ගෙවිය යුතු වන්දි පිළිබඳව කිසිදු අධිකරණ තීන්දුවක් ලැබී නොමැති බැවින් හිමිකම් රක්ෂණ අරමුදල මඟින් කිසිදු හානිපූර්ණ වන්දියක් ගෙවා නොමැත.

04. මූල්‍ය වාර්තා

4.1 මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය



හිමිකම් රක්ෂණ අරමුදල
2023.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

රු.

2022.12.31		2023.12.31
	වත්කම්	
-	ආයෝජන - 01). රිපෝ බිල්පත්	
134,450,254.27	02). භාණ්ඩාගාර බැඳුම්කර	184,419,762.75
134,450,254.27		184,419,762.75
	ජංගම වත්කම්	
3,125,666.84	ලැබිය යුතු ආයෝජන පොළී (උපලේඛන අංක 3)	5,837,336.81
1,046,508.43	බැංකු ශේෂය	2,954,490.41
4,172,175.27		8,791,827.22
138,622,429.54	මුළු වත්කම්	193,211,589.98
	අඩු කළා : ජංගම වගකීම්	
296,400.00	ගෙවිය යුතු විගණන ගාස්තු	-
296,400.00		
138,326,029.54	ශුද්ධ වත්කම්	193,211,589.98
112,859,215.01	සමුච්චිත අරමුදල	138,326,029.54
25,466,814.53	එකතු කළා : මෙහෙයුම් අතිරික්තය	54,885,560.44
138,326,029.54	අරමුදල	193,211,589.98


ඉහත ගිණුම් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අනුව පිලියෙළ කර ඇති බවත් එම ගිණුම්වල නිවැරදි භාවය පිළිබඳ වගකීම් දරන බවත් සහතික කරමි.

ඩබ්.ආර්.ඒ.එස්.ඩබ්ලිව්. විජයසිංහ
රෙජිස්ට්‍රාර් ජනරාල්/සභාපති
හිමිකම් රක්ෂණ අරමුදල

ආර්.ටී.කේ වැලිවිටගේ
ප්‍රධාන ගණකාධිකාරී
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

දිනය: 2024/02/29

4.2 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය



හිමිකම් රක්ෂණ අරමුදල
2023.12.31 න් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය

2022.12.31 ට තක්ෂ ආදායම් / වියදම්			2023.12.31 ට තක්ෂ ආදායම් / වියදම්	2023 ඇස්තමේන්තුගත ආදායම් / වියදම්	විචලනය %
	අයභාරය				
14,564,873.52	හිමිකම් ලියාපදිංචි කිරීමේ ආදායම්		35,381,084.00	16,000,000.00	121.13%
	2022 වර්ෂයේ ආදායම් අඩුවෙන් ඇස්තමේන්තු කිරීම් ගැලපීම්				
11,680,777.07	භාණ්ඩාගාර ආශෝධන පොළී ආදායම්		20,569,533.87	13,000,000.00	58.23%
	රිපෝ බිල්පත් පොලී ආදායම්	205,976.06			
	බැඳුම්කර පොලී ආදායම්	14,277,302.26			
	ලැබිය යුතු පොලී ආදායම්	5,837,336.81			
	භාණ්ඩාගාර බැඳුම්කර අධිභාරය (Premium)	248,918.73			
26,245,650.59	මූළු අයභාරය		55,950,617.87		
	වියදම්				
138,000.00	කළමනාකරණ කමිටු දීමනා		132,000.00	432,000.00	-69%
24,000.00	විගණන කළමනාකරණ කමිටු දීමනා		24,000.00	96,000.00	-75%
591,642.06	කාර්ය මණ්ඩල දීමනා		553,113.43	610,000.00	-9%
25,194.00	සංග්‍රහ වියදම්		37,819.00	75,000.00	-50%
	විගණන ගාස්තු		283,890.00	400,000.00	-29%
-	ලිපි ද්‍රව්‍ය		34,235.00	2,250.00	1422%
778,836.06	මූළු වියදම්		1,065,057.43		
25,466,814.53	කාලපරිච්ඡේදය සඳහා අතිරික්තය		54,885,560.44		

ඩබ්.ආර්.ඒ.එන්.එස්. විජේසිංහ
රෙජිස්ට්‍රාර් ජනරාල්/ සභාපති
හිමිකම් රක්ෂණ අරමුදල


ඩබ්.ආර්.ඒ.එන්.එස්. විජේසිංහ
රෙජිස්ට්‍රාර් ජනරාල්
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
අංක. 234/1සී, ඩෙක්සිල් කොඩිබඳහුව මාවත
කොස්වත්ත, බත්තරමුල්ල.

දිනය 2024/02/28

ආර්.ටී.කේ වැලිවිටගේ
ප්‍රධාන ගණකාධිකාරී

ආර්.ටී.කේ. වැලිවිටගේ
ප්‍රධාන ගණකාධිකාරී
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
කොස්වත්ත, බත්තරමුල්ල.

4.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය



හිමිකම් රක්ෂණ අරමුදල
2023.12.31 න් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය


රු.

2022.12.31			2023.12.31	
		මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහයන්		
		ලැබීම්		
14,564,873.52		හිමිකම් ලියාපදිංචි කිරීමේ ආදායම	35,381,084.00	
10,571,990.27		ආයෝජන වලින් උද්ද පොලිය	17,857,863.89	
		පිපෝ බිල්පත් පොලී ආදායම	205,976.06	
		භාණ්ඩාගාර බැඳුම්කර ආයෝජනයෙන් උද්ද පොලිය	19,624,183.99	
		භාණ්ඩාගාර බැඳුම්කර අධිභාරය (Premium)	248,918.73	
		භාණ්ඩාගාර බැඳුම්කර පොලියෙන් ආපසු ගෙවන පොලිය	(2,221,214.89)	
	25,136,863.79			53,238,947.89
		ගෙවීම්		
591,642.06		කාර්ය මණ්ඩල දීමනා	553,113.43	
25,194.00		සංග්‍රහ වියදම්	37,819.00	
138,000.00		කළමනාකරණ කමිටු දීමනා	132,000.00	
24,000.00		විගණන කළමනාකරණ කමිටු දීමනා	24,000.00	
		විගණන ගාස්තු	580,290.00	
		ලිපිදුවිය ගාස්තු	34,235.00	
	(778,836.06)			(1,361,457.43)
	24,358,027.73	මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය		51,877,490.46
	109,581,703.95	ආයෝජන ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහයන්		
		කල් පිරුණු භාණ්ඩාගාර බිල්පත්		134,450,254.27
	134,450,254.27	ආයෝජන වල විවිනාකම්		184,419,762.75
	24,868,550.32	ආයෝජන ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහයන්		(49,969,508.48)
	(510,522.59)	මුදල් හා මුදල් හා සමාන දෑ වල ශුද්ධ වැඩිවීම /අඩුවීම		1,907,981.98
	1,557,031.02	කාලපරිච්ඡේදය ආරම්භයේ වූ මුදල් හා මුදල් සමාන දෑ		1,046,508.43
	1,046,508.43	කාලපරිච්ඡේදය අවසානයේ වූ මුදල් හා මුදල් සමාන දෑ		**2,954,490.41**

ආර්.ටී.කේ. වැලිවිටගේ
ප්‍රධාන ගණකාධිකාරී
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

ආර්.ටී.කේ. වැලිවිටගේ
ප්‍රධාන ගණකාධිකාරී
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
ගොඩවත්ත, බත්තරමුල්ල.

4.4 ලැබීම් හා ගෙවීම් ගිණුම



හිමිකම් රක්ෂණ අරමුදල
2023.12.31 න් අවසන් වර්ෂය සඳහා
ලැබීම් හා ගෙවීම් ගිණුම

රු

2022.12.31		2023.12.31	
1,557,031.02	2022.12.31 දිනට ශේෂය		1,046,508.43
	ලැබීම්		
109,107,421.52	ආයෝජන කල් පිරීම- භාණ්ඩාගාර බැඳුම්කර		134,450,254.27
474,282.43	ආයෝජන කල් පිරීම- රිපෝ බිල්පත්		-
14,564,873.52	හිමිකම් ලියාපදිංචි කිරීමේ ආදායම		35,381,084.00
174,887.14	රිපෝ බිල්පත් ආයෝජනයෙන් ලද පොළිය	205,976.06	
12,297,458.24	භාණ්ඩාගාර බැඳුම්කර ආයෝජනයෙන් ලද පොළිය	19,624,183.99	
(759,863.65)	භාණ්ඩාගාර බැඳුම්කර අධිභාරය (Premium)	248,918.73	
(1,140,491.46)	භාණ්ඩාගාර බැඳුම්කර පොලියෙන් ආපසු ගෙවන පොලිය	**(2,221,214.89)**	
10,571,990.27			17,857,863.89
136,275,598.76	**මුළු ලැබීම්**		188,735,710.59
	ගෙවීම්		
134,450,254.27	භාණ්ඩාගාර බැඳුම්කර වල ආයෝජන		184,419,762.75
-	රිපෝ බිල්පත් වල ආයෝජනය		
138,000.00	කළමනාකරණ මණ්ඩල කමිටු දීමනා		132,000.00
-	විගණන කළමනාකරණ කමිටු දීමනා		24,000.00
591,642.06	කාර්ය මණ්ඩල දීමනා		553,113.430
25,194.00	සංග්‍රහ වියදම්		37,819.00
24,000.00	විගණන ගාස්තු		580,290.00
	ලිපිදවිල		34,235.00
-	වැරදි නිවැරදි කිරීම්		
135,229,090.33	**මුළු ගෙවීම්**		185,781,220.18
1,046,508.43	**2023.12.31 දිනට අවසන් ශේෂය**		**2,954,490.41**
-			

ආර්.ටී.කේ වැලිවිටගේ
ප්‍රධාන ගණකාධිකාරී
රෙජිස්ට්‍රාර් ජනරාල් වෙනුවට

ආර්.ටී.කේ. වැලිවිටගේ
ප්‍රධාන ගණකාධිකාරී
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
කොළඹ 08, බෞද්ධාලෝක මාවත.


4.5 ශුද්ධ වත්කම් / ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය

හිමිකම් රක්ෂණ අරමුදල
2023.12.31 වන් අවසන් වර්ෂය සඳහා
ශුද්ධ වත්කම්/ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශනය

රු

	පාලන අක්ෂිකත්වයේ අයිතිකරුවන්ට අයත් වන					සුළු කොටස් හිමි අයිතිය	මුලු ශුද්ධ වත්කම් /ස්කන්ධය
	සහභාගී වූ ප්‍රාග්ධනය	වෙනත් සංචිත	පරිවර්තන සංචිතය	සමුච්චිත ලාභ/(අලාභ)	මුලු එකතුව		
2023.01.01 දිනට ශේෂය	-	-	-	138,326,029.54	138,326,029.54	-	138,326,029.54
ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනස්වීම	-	-	-	-	-	-	-
නැවත ප්‍රකාශිත ශේෂය	-	-	-	-	-	-	-
2023 සඳහා ශුද්ධ වත්කම්/ ස්කන්ධයෙහි වෙනස්වීම	-	-	-	-	-	-	-
දේපල ප්‍රතිඇගයීමෙන් ඇති අතිරික්තය	-	-	-	-	-	-	-
ආයෝජන ප්‍රතිඇගයීමෙන් ඇති අලාභ	-	-	-	-	-	-	-
විදේශ මෙහෙයුම් විකිණීම පරිවර්තන අලාභය	-	-	-	-	-	-	-
ශුද්ධ වත්කම්/ ස්කන්ධයෙහි සෘජුනොවන ලෙ ශුද්ධ අයකරණයෙහි වර්ධනය	-	-	-	-	-	-	-
කාලපරිච්ඡේදය සඳහා ලැ අතිරික්තය	-	-	-	54,885,560.44	54,885,560.44	-	54,885,560.44
කාලපරිච්ඡේදය සඳහා සමූහාගක මුලු අනුයුති සහ විසඳුම්	-	-	-	-	-	-	-
2023.12.31 දිනට ඉතිරියට ගෙන ගිය ශේෂය	-	-	-	193,211,589.98	193,211,589.98	-	193,211,589.98

4.6 ශේෂ පිරික්සුම



හිමිකම් රක්ෂණ අරමුදල
2023.12.31 න් අවසන් වර්ෂය සඳහා
ශේෂ පිරික්සුම

රු

විස්තරය	හර	බැර
සමුච්චිත අරමුදල	-	138,326,029.54
රිපෝ බිල්පත් වල ආයෝජන ගිණුම		
භාණ්ඩාගාර බිල්පත් වල ආයෝජන ගිණුම	184,419,762.75	
බැඳුම්කර වල පොළී ආදායම් ගිණුම	-	20,114,639.08
රිපෝ බිල්පත් වල පොළී ආදායම් ගිණුම		205,976.06
භාණ්ඩාගාර බැඳුම්කර අධිභාරය (Premium)		248,918.73
හිමිකම් ලියාපදිංචිකිරීමේ ආදායම් ගිණුම	-	35,381,084.00
ලැබිය යුතු පොළී ගිණුම (උපලේඛන අංක 3)	5,837,336.81	-
කාර්ය මණ්ඩල දීමනා ගිණුම	553,113.43	-
සංග්‍රහ වියදම් දීමනා ගිණුම	37,819.00	-
කළමනාකරණ මණ්ඩල රැස්වීම් දීමනා ගිණුම	132,000.00	-
විගණන කළමනාකරණ කමිටු දීමනා	24,000.00	-
විගණන ගාස්තු ගිණුම	283,890.00	-
ලිපිදව්‍ය	34,235.00	
බැංකු ශේෂය	2,954,490.41	-
	194,276,647.41	**194,276,647.41**

ආර්.ටී.කේ වැලිවිටගේ
ප්‍රධාන ගණකාධිකාරී
රෙජිස්ට්‍රාර් ජනරාල් වෙනුවට

ආර්.ටී.කේ. වැලිවිටගේ
ප්‍රධාන ගණකාධිකාරී
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
බොරැල්ලෙහේන, බත්තරමුල්ල.

4.7 මූල්‍ය ප්‍රකාශය පිළිබඳ සටහන්

සටහන්

මූල්‍ය ප්‍රකාශය පිළිබඳ සටහන්

01. ආයතනික තොරතුරු

හිමිකම් ලියාපදිංචිය සඳහා ආරක්ෂිත ජාලයක් සැපයීමත් සහ හානියකට හෝ අලාභයකට මුහුණ දෙන පුද්ගලයන් හට අධිකරණ නියෝග මත වන්දි ගෙවීමත් පරමාර්ථ කොටගෙන 1998 අංක 21 දරණ හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 67 වන වගන්තියට 2009 අගෝස්තු 21 දින ගෙන එන ලද සංශෝධනයට අනුකූලව මෙම අරමුදල ක්‍රියාත්මක වේ. හිමිකම් රක්ෂණ අරමුදලේ කාර්යාලය අංක 234/ඒ3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල යන ලිපිනයේ පිහිටා ඇත.

02. සැකසීමේ මූලධර්ම

1998 අංක 21 දරණ හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත සහ එහි සංශෝධන වලට අනුකූලව ගිණුම් ප්‍රකාශ පිළියෙල කර ඇත.

2.1 අනුකූලතා ප්‍රකාශය

හිමිකම් රක්ෂණ අරමුදලේ මූල්‍ය ප්‍රකාශ රජයේ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත (SLPSAS) වලට අනුකූලව පිළියෙල කර ඇත.

2.2 අඛණ්ඩතාව

හිමිකම් රක්ෂණ අරමුදල දිගටම පවත්වාගෙන යාමේ හැකියාව සහ එය විසුරුවා හැරීමට හෝ නවතා දැමීමට අදහස් නොකරන බවට එහි අධ්‍යක්ෂ මණ්ඩලය මඟින් තහවුරු කර ඇත.

03. ආදායම

2023 වර්ෂයේ හිමිකම් ලියාපදිංචි කිරීමේ ගාස්තු වශයෙන් ලද ආදායමෙන් 40% ක් අරමුදලට ප්‍රේෂණය කර ඇති අතර එම මුදල රු. **35,381,084.00** කි. *(උපලේඛන අංක -01)*

04. කාර්ය මණ්ඩල දීමනා

පරිපාලන කාර්ය මණ්ඩලයේ 06 දෙනෙකු සඳහා කාර්ය මණ්ඩල දීමනා ගෙවා ඇත.

05. කළමනාකරණ කමිටු දීමනා

කළමනාකරණ මණ්ඩල සහ විගණන කළමනාකරණ කමිටු දීමනා සඳහා රුපියල් 156,000.00 ක් ගෙවීම් කර ඇත.

06. විගණන ගාස්තු

2021 හා 2022 වර්ෂ සඳහා 2023 වර්ෂයේදී විගණන ගාස්තු ලෙස රුපියල් 580,290.00 ක මුදලක් ගෙවා ඇත.

07. ආයෝජන

2023 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර බැඳුම්කර වල වටිනාකම රුපියල් 184,419,762.75 කි. (උපලේඛන අංක 03)

08. ආයෝජන මත පොළී

ලැබිය යුතු ආයෝජන පොලී

2023.12.31 දිනට භාණ්ඩාගාර බැඳුම්කර (උපලේඛන 03)	5,837,336.81

භාණ්ඩාගාර බිල්පත් පොලී ආදායම

2023.12.31 දිනට භාණ්ඩාගාර බැඳුම්කර වලින් ලැබිය යුතු පොලිය (උපලේඛන 03)		5,837,336.81
2023.12.31 භාණ්ඩාගාර බැඳුම්කර පොලිය	(උපලේඛන 03)	14,277,302.26
2023.12.31 දිනට රිපෝ බිල්පත් වලින් ලැබුණු පොලිය	(උපලේඛන 02)	205,976.06
		20,320,615.13

ලැබුණු ආයෝජන පොලී

2023.12.31 දිනට රිපෝ බිල්පත් වලින් ලැබුණු පොලිය	(උපලේඛන 02)	205,976.06
2023.12.31 භාණ්ඩාගාර බැඳුම්කර වලින් ලැබුණු පොලිය	(උපලේඛන 03)	19,624,183.99
		19,830,160.05

05.විගණකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. JLO/G/RGD-TIF/FA/2023/01 ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2024 මැයි 29 දින

රෙජිස්ට්‍රාර් ජනරාල්,

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

හිමිකම් රක්ෂණ අරමුදලේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ චෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11 (1) වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 නත්ත්වාගණනය කළ මතය

හිමිකම් රක්ෂණ අරමුදලේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක හිඟුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ කොරතුරු ද ඇතුළුන් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ නත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, අරමුදලේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ හිඟුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

2009 අංක 01 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ (රක්ෂණ අරමුදල්) නියෝග අංක 42 (ආ) ප්‍රකාරව, හිමිකම් රෙජිස්ට්‍රාර්වරුන් විසින් සති 02 කට වරක් හිමිකම් ආදායම් සම්බන්ධ වාර්තා ප්‍රධාන කාර්යාලය වෙත ලබාදිය යුතු වුව ද, හිමිකම් රෙජිස්ට්‍රාර් කාර්යාල 28 කින් ලබාදිය යුතු ආදායම් වාර්තා 672 කින් වාර්තා 50 ක් සමාලෝචිත වර්ෂය තුළ ලැබී නොතිබුණු අතර, අරමුදලේ ආදායම් ලැබීම් වටිනාකම් ගණනය සඳහා එම ආදායම් වාර්තා පදනම්කර ගැනීම වෙනුවට අදාළ කාර්යාල විසින් බැංකු ගතකරන මුදල් වටිනාකම මත එය ගණනය කර ආදායමට ගෙන තිබුණි. ඒ හේතුවෙන් අරමුදලේ මුළු ලැබීම්වල වටිනාකමේ නිරවද්‍යතාවය තහවුරු කරගත නොහැකි විය.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම් වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් කැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට ගැනිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතු ය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි නනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, වෙනනාන්විත මඟ හැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව ද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේ ද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමුකළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය වීකරණය කළ යුතු ය. කෙසේ වුව ද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන්වීමට හැකි ය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීති, රීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
2009 අංක 01 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ (රක්ෂණ අරමුදල්) නියෝග අංක 42 (ඉ)	සෑම දින 14 ක් අවසානයේදී ම හිමිකම් රෙජිස්ට්‍රාර්වරුන් විසින් එකතු කරගන්නා මුදල් හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් ප්‍රධාන මුදල් පොකට් වෙන් වෙන් වශයෙන් හර කළ යුතු වුව ද, දෛනික ආදායම් ලෙස දිනපතා ලැබීම්වල එකතුවක් මුදල් පොකට් හර කර තිබුණි.

3.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

(අ) 2009 අංක 01 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ (රක්ෂණ අරමුදල්) නියෝග 42(ආ) හා (ඇ) ප්‍රකාරව ඇතැම් හිමිකම් කාර්යාල විසින් ප්‍රධාන කාර්යාලය වෙත එවන ලද හිමිකම් ආදායම් පිළිබඳ වාර්තා "ආර්.ජී.ටී/අයි.එෆ් 03" ආකෘතියට අනුකූල නොවූවද කළමනාකරණය විසින් නිවැරදි ආකෘතිය සහිත වාර්තා ගෙන්වා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) අරමුදලේ මූල්‍ය ප්‍රකාශන කළමනාකරණ මණ්ඩලය විසින් අනුමත කළ බවට සනාථ වන කළමනාකරණ මණ්ඩල රැස්වීම් වාර්තාව විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. කළමනාකරණ මණ්ඩලය වෙනුවෙන් එහි සභාපතිවරයා විසින් පමණක් මූල්‍ය ප්‍රකාශන අත්සන් කර තිබුණි. හිමිකම් රක්ෂණ අරමුදලෙහි තීරණ හා මාර්ගෝපදේශ වාර්තාව අනුව සභාපතිවරයාට අමතරව මූල්‍ය ප්‍රකාශන අත්සන් කළ යුතු නිලධාරියා කවරෙකුද යන්න කළමනාකරණ මණ්ඩලය විසින් හඳුනාගෙන නොතිබුණු අතර මෙම වාර්තාව නිකුත් කරන දිනය වන විට එම නිලධාරියා කවරෙකුද යන්න කළමනාකරණ මණ්ඩලය විසින් හඳුනාගෙන තිබුණි.

3.3 කාර්ය සාධනය

(අ) 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ ඉඩම්වල අයිතිය ලියාපදිංචි කිරීමේදී අයිතිය සම්බන්ධයෙන් වැරදි තීරණයක් ගැනීම හේතුවෙන් පාර්ශවකරුවන්ට සිදුවන අලාභ සඳහා රජය විසින් වන්දි ප්‍රදානය කිරීම අරමුදල පිහිටුවීමේ ප්‍රධාන අරමුණ විය. එසේ වුවද වන්දි ඉල්ලා නඩු පැවරීමක් සිදුකර නොතිබුණු බැවින්, අධිකරණ ආඥාවක් මඟින් වින්දිතයකු නම්කර නොමැති නිසා අරමුදල ආරම්භ වූ 2010 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා කිසිදු හානිපූරණ

වන්දි මුදලක් ගෙවීමකර නොතිබුණි. තවද, හිමිකම් රක්ෂණ අරමුදල සම්බන්ධයෙන් පොදු ජනතාව දැනුවත් කිරීම් සිදුකර ඇති බවට විගණනයේදී නිරීක්ෂණය නොවුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව කළමනාකරණ මණ්ඩල රැස්වීම් වාර 08 ක් පැවැත්වීමට සැලසුම්කර තිබුණද 2023 වර්ෂයේදී කළමනාකරණ මණ්ඩල රැස්වීම් වාර 04 ක් පමණක් පවත්වා තිබුණි.

3.4 අයවැය ලේඛනමය පාලනය

2023 වර්ෂයේ අවස්ථා හතරකදී අයවැයගත වියදම හා තථ්‍ය වියදම අතර සියයට 68 සිට සියයට 1,422 දක්වා විචලනයන් නිරීක්ෂණය වූ බැවින් අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති